Sri Lanka Journal of
Economic Research
Volume 1(1)
December 2013:131-141
Sri Lanka Forum of
University Economists

# සංවර්ධනයේ තිරසාරත්වය සහ බෞද්ධ ආර්ථික දර්ශනය
# Sustainability of Development and Buddhist Economics

**පූජ්‍ය අගලකඩ සිරිසුමන හිමි**
*සිංහල අධ්‍යයනාංශ ප්‍රධානී, කොළඹ විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව*

***Venerable Agalakada Sirisumana Thero***
*Head, Department of Sinhala, University of Colombo, Sri Lanka*

---

***Abstract***

*සෑම පුද්ගලයකුම අර්ථ ශාස්ත්‍රයේ විග්‍රහ කෙරෙන අයුරින් “තාර්කික” විය යුතු ද? අසීමාන්තික පරිභෝජන පෙළඹීමෙන් මිදීමට මිනිසාට නො හැකි ද? සියලු මිනිසුන් තම අවශ්‍යතා සපුරාගැනීමට නැඹුරු වන නමුත් අසීමාන්තික පරිභෝජන පෙළඹීමට නතු නො වී සිටිය හැකි ය. බෞද්ධ අර්ථ ශාස්ත්‍රයෙන් ඉදිරිපත් කෙරෙන්නේ එවැනි සුසමාදර්ශයකි. බෞද්ධ ආර්ථික දර්ශනය තුළ තිරසාරත්වය වෙත පවත්නා යොමුව ආශ්‍රිතව මෙම සටහන ගොඩනැගෙයි. මෙහි දී ධන නිෂ්පාදනය හා පරිහරණය, ශ්‍රම සබඳතා, අරපිරිමැස්ම, පරිසර සංරක්ෂණය, භෞතික සම්පත් හිමිකාරත්වය ආදී මාතෘකා කිහිපයක් සැලකිල්ලට ගැනෙයි. ඒ තුළින් තිරසාරත්වය පිළිබඳ වැදගත් බෞද්ධ ඉගැන්වීම් ඉස්මතු කර දක්වනු ලැබෙයි.*

*Are all economic actors ‘rational’? Is boundless acquisitiveness an incurable attribute of homo economicus? Buddhist Economics contends that, while the desire to fulfil one’s needs is inherent to the human condition, the excessive and insatiable pursuit of profit and acquisitions is not. Hence, it seeks economic growth through sustainable means: an effort that is particularly relevant in a world of economic extremes. ‘Sustainable Development and Buddhist Economic Philosophy’ examines the relevance of Buddhist Economics to labour relations, the achievement of productive and allocative efficiency, the promotion of environmental conservation, and the common ownership of resources, and its enduring contributions to sustainable development.*

---

සංලක්ෂ්‍ය / Remark :

*මෙම ලිපිය සැකැසීමේ දී කොළඹ විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යා අධ්‍යයනාංශයේ ආචාර්ය ලලිතසිරි ගුණරුවන් මහතාගෙන් සහ තිළිණි සමරසේකර මෙනෙවියගෙන් ලද දායකත්වයට කර්තෘගේ කෘතඥතාව හිමි වේ.*

*The Author wishes to acknowledge the contributions made by Dr Lalithasiri Gunaruwan and Ms Thilini Samarasekera of the Department of Economics of the University of Colombo, in compiling this article.*

**පදනම**

සම්පත් සීමිත ය, විකල්ප ප්‍රයෝජන සහිත ය. එහෙත් මිනිස් වුවමනා අසීමිතව වැඩෙන සුළු ය. එ සේ අසීමිත වූ වුවමනා සපුරා ගැනීමේ දී විකල්ප ප්‍රයෝජන සහිත සීමිත සම්පත් වඩා කාර්යක්‍ෂමව හා ඵලදායීව උපයෝජනය කර ගැනීම අර්ථ ශාස්ත්‍රයේ කේන්ද්‍රීය විෂය වෙයි. ඒ අනුව බිහි වන තේරීම හා හිඟතාව මත ජනනය වන ප්‍රශස්තකරණ ගැටලුව ඔස්සේ මිනිස් පරිභෝජන ආශා තෘප්ත කර ගැනීමට මෙන්ම ඊට උවමනා වන භාණ්ඩ හා සේවා නිෂ්පාදනය හා බෙදා හැරීම කෙරෙහි ආර්ථික විශ්ලේෂණයේ මූලික අවධානය යොමු කෙරෙයි. එම ආර්ථික ක්‍රියාකාරකම් සහ ඊට අවශ්‍ය යෙදවුම්වල කාර්යක්‍ෂම හා ඵලදායී කළමනාකරණය අදාළ ව්‍යවසායකත්වය තුළින් සිදු වේ. නිදහස් වෙළෙඳපොළ ක්‍රමය තුළින් මෙම කටයුතු සිදු කෙරෙන අයුරු සහ ශ්‍රම විභජනය තුළින් කාර්යක්‍ෂමතාව ඉහළ දමා ගැනීමට හා ඵලදායීතාව වර්ධනය කර ගැනීමට මෙන්ම ලාභ උපරිම කරගැනීමට හැකි වන අයුරු සම්භාව්‍ය අර්ථ ශාස්ත්‍රයේ පියා ලෙස සැලකෙන ඇඩම් ස්මිත් තම *"ජාතීන්ගේ ධනය" [Wealth of Nation]* කෘතියෙන් පුළුල් ලෙස සාකච්ඡා කරයි.

ප්‍රංශ ජාතික ආර්ථික විද්‍යාඥයෙකු වූ ෂෝන් බැප්ටිස්ට් සේ (Jean Baptiste Say) විසින් ඉදිරිපත් කරන ලද සැපයුම් න්‍යාය තුළ කියවෙන්නේ ද නිෂ්පාදනය හෙවත් සැපයුම මඟින් ඉල්ලුම ඉදිරියට මෙහෙයවෙන බැවින් ආර්ථික වෘද්ධිය ළඟා කර ගැනීම සඳහා කළ යුතු වන්නේ නිමැවුම ඉහළ දැමීම බවයි. තව ද, කේම්බ්‍රිජ් ගුරු කුලයේ ප්‍රබල පුරුකක් වූ නිකොලස් කැල්ඩෝර් (1957) තම *"ආර්ථික වෘද්ධි ආකෘතිය" [A Model of Economic Growth]* නම් ලිපිය තුළින් ජනගහන වර්ධනය, එම ජනගහනයේ ඉතුරුම් නැඹියාව සහ නව නිපැයුම් හා සොයා ගැනීම් තුළින් සිදු කෙරෙන ඵලදායිතාවයේ වර්ධනය රටක ආර්ථික වර්ධනය කෙරෙහි බලපාන මුඛ්‍ය සාධක තුන ලෙස හඳුනාගනු ලැබ ඇත. මේ සියලු කරුණු මත පැහැදිලිවම එළැඹිය හැකි නිගමනය වනුයේ ආර්ථික විද්‍යාව තුළ සිදු කෙරෙනුයේ අසීමිත මිනිස් වුවමනා සපුරාලීමට අවශ්‍ය භාණ්ඩ හා සේවා නිෂ්පාදන උදෙසා මිනිසා සතු සීමිත සම්පත් ගැලපීමේ නව මාර්ග සොයා ගැනීමට උත්සාහ දැරීම බවයි.

අසීමිත බවට නිර්ණය කෙරෙන මිනිස් වුවමනා සන්තර්පනය කිරීමේ මෙම අත්තිවාරම මත අර්ථ ශාස්ත්‍රය විසින් බොහෝ ආකෘති ගොඩනගනු ලැබ ඇත. හැකි උපරිම මට්ටමින් යෙදවුම් තමන් සතු කර ගැනීමේ අභිලාෂය මෙන්ම අවම යෙදවුමක් තුළ ඉහළම නිමැවුමක් හඹා යෑමේ ප්‍රයත්නය ද එම ආකෘතිවල ආවේණික ලක්‍ෂණ වේ. සම්පත්වල අයිතිය සහ භාවිතයේ ඵලදායිතාව (හෝ කාර්යක්ෂමතාව) නැමැති සංකල්ප මෙම ආකෘතිවල ප්‍රතිඵලයන් ය. ශ්‍රම සම්පත සූරා කෑම සහ යටත්විජිතකරණය මෙම ආකෘති විසින් සුජාතකරණය කරන ලද බව පැහැදිලි වේ. මෙ වැනි සමාජ, ආර්ථික ප්‍රතිවිපාක නිරීක්‍ෂණය කෙරෙන විට ඊට පිළියම් ලෙස තව ද සංකල්ප හා ආකෘතීන් ගොඩනැඟීමට අපි පෙළඹෙමු. සමාජවාදය, කොමියුනිස්ට්වාදය, මූල්‍යවාදය පමණක් නොව වෙළෙඳපොළ අසාර්ථකතා සහ තිරසාරත්වය ද ඊට උදාහරණ ලෙස ගෙන හැර දැක්විය හැකි ය. වෙළෙඳපොළ තරගයෙන් දිනීම උදෙසා විවිධ උපායයන් යෙදීමට ද, අලෙවිකරණය ඉහළ නැංවීමේ අපේක්‍ෂාවෙන් පාරිභෝගිකයා තුළ පවත්නා ආශා සන්තර්පනය කර ගැනීමේ ගිජුකම මෝදු කරවන ප්‍රචාරණ ක්‍රමවේදයන් දියත් කිරීමට ද මෙම රාමුවෙන් දිරි ලැබෙන්නේ නිතැතිනි. මිනිසාගේ මූලික අවශ්‍යතාවන් ඉක්මවා, වුවමනාවන් මැවීම මෑතකාලීනව නිෂ්පාදකයන්ගේ ඉලක්ක බවට පත්ව තිබීමෙන් මේ බව පිළිබිඹු වෙයි. තව

ද, දිරි ගැන්වෙන පාරිභෝගිකයා සතුව ප්‍රමාණවත් ක්‍රය ශක්තියක් නොමැති නම් ඔවුන් ගේ සඵල ඉල්ලුම උද්දීපනය කිරීමේ කේන්සියානු නිර්දේශයන් ද ඉදිරිපත් කරනු ලැබෙයි, ඉදිරි ආදායම් උගසට තැබෙන පරිදි ණය බැරපත් ලබා දීම වැනි මූල්‍ය උපායමාර්ග ද දැඩි ලෙස මූල්‍යකරණයට ලක් වී ඇති[1] වර්තමාන ආර්ථිකයන් හි භාවිත කෙරෙයි. ඉන් පරිභෝජනය දිරි ගැන්වී ඒ හරහා ආර්ථික වෘද්ධියට පිටුබලයක් ලැබිය හැකි නමුත් දිගුකාලීන ණයගැති බව ද ඒ සමගම නිතැතින්ම වර්ධනය වෙයි. ප්‍රශ්නයට ඉදිරිපත් කෙරෙන පිළිතුරම නැවත ප්‍රශ්නයක් වන්නේ ඒ අයුරිනි. මෙය, ප්‍රස්තුත ගැටලුවට හේතු පාදක වන රාමුවක් තුළින්ම අදාළ ගැටලුවට පිළිතුරු සෙවීමේ විශම චක්‍රයට නූතන ආර්ථික විශ්ලේෂණ ක්‍රමවේදයන් ගොදුරු වීමේ ප්‍රතිඵලයකි. එහෙත්, අසීමිත මිනිස් වුවමනා තෘප්ත කිරීමේ සන්දර්භය තුළම විසඳුම් සෙවීමට උත්සාහ කිරීම විනා එම සන්දර්භය අභියෝගයට ලක් කිරීමක් නූතන ආර්ථික විද්‍යා විග්‍රහය තුළ නිරීක්ෂණය කෙරෙන්නේ නම් ඒ අල්ප වශයෙනි.

අනෙක් අතට, නූතන ආර්ථික දැක්ම විසින් ගොඩනගනු ලැබ ඇති ලෝකය පිළිබඳව කිසි අයකුට සතුටු විය හැකි ද? ගෝලීය මිනිස් ප්‍රජාවගෙන් අඩකටත් වඩා අන්ත දිළිඳුකමින් පෙළෙද්දී අතළොස්සකට අධි පරිභෝජන අවස්ථා උදා කර දී ඇති අර්ථ රටාවක් පිළිබඳව තෘප්තිමත් විය හැකි ද? රටවල් විශාල සංඛ්‍යාවක් ඌන සංවර්ධනයේ ගිලෙද්දී ලෝක ජනගහනයෙන් ඉතා සුළු ප්‍රතිශතයක් ජීවත් වන සංවර්ධිත රටවල් ගෝලීය සම්පත්වලින් අතිමහත් බහුතරයක් පරිභෝජනය කිරීමට යොමු කළ ආර්ථික සන්දර්භයක් වෙත මානව සුබසාධනයේ අනාගතය භාර දිය හැකි ද? පවත්නා පාරිසරික හා සම්පත් පීඩන තත්වයන් හමුවේ ඇමෙරිකා එක්සත් ජනපදයේ හෝ යුරෝපයේ පුරවැසියන් ගේ ඒක පුද්ගල සම්පත් ප්‍රමාණය භුක්ති විඳින මට්ටමට[2] ආසියාවේ, අප්‍රිකාවේ හෝ ලතින් අමෙරිකාවේ ආර්ථික වෘද්ධියක ඇති වුවහොත් එය දරා ගැනීමට මිහිතලයට හා ජෛව ගෝලයට හැකි වනු ඇති ද? නො එසේ ව, එවන් වූ පරිභෝජන මට්ටමක් දැනට ඌන සංවර්ධිත කලාපයන් අනාගතයේ දී අත්පත් කර නො ගත යුතු බව පවත්නා මූල ප්‍රවාහ ආර්ථික රාමුවේ පිළිගැනීම ද? පිළිතුර මින් කවරක් වුවත් ඉන් ගම්‍ය කෙරෙන ලෝකයේ පැවැත්ම සාධාරණ ද? යථාර්ථවාදී ද? ධරණීය ද?

මෙම සන්දර්භයට සැබෑ ලෙසම විකල්පයක් නොමැති දැයි විමසනු ලැබීම ඒ අනුව ඉතා තාර්කික හා කාලීන අවශ්‍යතාවකි. මෙහි දී පළමු කොට ඉස්මතු වන්නේ සෑම පුද්ගලයකුම තම අසීමිත උවමනාවන් සහ ආශාවන් තෘප්ත කිරීම සහ තම උපයෝජනය උපරිම කර ගැනීම පසුපස හඹායන සම්භාව්‍ය ආර්ථික රාමුවේ අර්ථ දැක්වෙන "තාර්කික මිනිසකු" විය යුතු ද යන ප්‍රශ්නයයි. මිනිසා ද සත්වයකු වුවත්, අසීමිත ලෙස පංචේන්ද්‍රියයන් පිනවීමට තිරිසනුන් තුළ පවත්නා කෑදරකමේ සත්ව සංඥාවෙන් මෙහෙයවනු ලැබීමෙන් බැහැරවීමට මිනිසාට නො හැකි ද? සෑම ආර්ථික නියෝජිතයකුම සූක්ෂම ආර්ථික විද්‍යා න්‍යායට

[1] මූල්‍ය පද්ධතිය අවශ්‍ය වන්නේ ආර්ථික කටයුතුවල පහසුවට නමුත් මේ වන විට මූල්‍ය සේවා අනෙකුත් ආර්ථික ක්ෂේත්‍ර අභිබවා යමින් හුදෙක් මූල්‍ය කටයුතු සඳහාම ප්‍රමාණාතික්‍රම ලෙස වර්ධනය වෙමින් තිබෙන බව මහාචාර්ය ලක්ෂ්මන් පවසයි. Lakshman W D (2012).

[2] මෙම සියවසේ මුල් දශකය තුළ ලෝකයේ ධනවාදී රටවල විශාල ආර්ථික අර්බුදයන් හටගත් බවත් ඉන් පසු මේ වනවිට යුරෝපාකරයේ ණය අර්බුදයක් මතු වී ඇති බවත් ඊට හේතුව මිනිසුන් තුළ ඇති දැඩි කෑදරකම හා අනවශ්‍ය ලෙස මුදල් වියදම් කිරීම බවත් සමහරුන් දක්වන බව සදාචාර ආර්ථික විද්‍යාව නැමැති තම කෘතිය තුළින් සෝමසුන්දර ගෙනහැර දක්වයි. ඇමරිකානුවන් බොහෝ දෙනෙක් අනවශ්‍ය ප්‍රමාණයට පරිභෝජනය කරන බවත් ධනයත් සමඟ මිනිසුන් අනවශ්‍ය ලෙස මුදල් වැය කිරීමේ සංස්කෘතියකට හුරු වී ඇති බවත් ඔහු පවසයි (සෝමසුන්දර ජේ ඩබ්ලිව් ඩී; 2013)

අනුව උපයෝගිතාව උපරිම කර ගැනීමට උත්සාහ දරන සහ කිසිවිටෙක තමා ලද සම්පත් ප්‍රමාණයෙන් සෑහිමකට පත් නොවන අතර අසීමිත වුවමනාවන් සන්තර්පණය කර ගැනීමට තරගකාරිව වෙහෙසෙන ස්වයං-අභිමතාර්ථ මුදුන් පමුණුවා ගැනීමේ ආත්මාර්ථකාමී අභිලාෂ සහිත වූවකු බවට සම්භාව්‍ය ආර්ථික විද්‍යා රාමුවේ එන එජ්වර්ත් ගේ (Edgeworth; 1881) මතය ඉන්දීය ආර්ථික විද්‍යාඥයෙකු වන අමාර්ත්‍යා සෙන් (1977) ප්‍රතික්ෂේප කරයි. ඔහු සඳහන් කරන පරිදි ආර්ථික තාර්කික මිනිසකු ලෙස "අන්තවාදී වීමට" මිනිසාට නො හැක. තම මූලික අවශ්‍යතා සපුරා ගැනීමට මිනිසා පෙළඹීම ස්වභාවික නමුත් අසීමාන්තික ලෙස ලාභ අපේක්ෂණය හෝ පරිභෝජනයෙන් තෘප්තිමත් වීමට නො හැකි වීමේ ගිජුකම සෑම මිනිසකු තුළම තිබීම අවශ්‍ය නො වේ. එසේ නම්. ඒ හරහා අභියෝගයට ලක් වන්නේ නූතන අර්ථශාස්ත්‍රයේ මූලික පදනමකි. එය දෙදරන්නේ නම් ඒ මත ගොඩනගනු ලැබ ඇති විශ්ලේෂණ විධික්‍රමයන්හි වලංගු බව ප්‍රශ්න කරනු ලැබීම අරුමයක් නො වේ. ඒ තුළ ආමන්ත්‍රණය කෙරෙනුයේ ආර්ථික දැක්මක් පිළිබඳව වන නව්‍ය වූ විග්‍රහ රාමුවකටය; නැතහොත් විකල්ප සුසමාදර්ශයකට ය.

### බෞද්ධ ආර්ථික දැක්ම

බෞද්ධ ආර්ථික දැක්මක් පිළිබඳව අර්ථ ශාස්ත්‍රඥයන්ගේ අවධානය යොමු වන්නේ මෙම සන්දර්භය තුළ ය. බටහිර ආර්ථික විද්‍යාඥයකු වන ෂූමාකර් (1967) දෘෂ්ටිකෝණ ගණනාවකින් බෞද්ධ අර්ථශාස්ත්‍රය සාධාරණීකරණය කරයි. ඔහු ප්‍රකාශ කරන්නේ ඕනෑම ආධ්‍යාත්මික හෝ ආගමික වටිනාකමකට වඩා ආර්ථික වර්ධනය වැදගත් යැයි පිළිගන්නා පුද්ගලයකුට පවා බෞද්ධ ආර්ථික විද්‍යාව වැදගත් වනු ඇති බවයි. එසේ වනුයේ, එ මඟින් නූතන වර්ධනය හා සාම්ප්‍රදායික එකතැන පල්වීම අතර තෝරා ගැනීමක් ඉදිරිපත් කරන නිසා පමණක් නොව, සංවර්ධනය වීමේ නිවැරදි මාර්ගය හෙවත් මධ්‍යම ප්‍රතිපදාවට මඟ පෙන්වන බැවිනි.

අසීමාන්තික කෑදරකම තුළින් ලබා ගන්නා කෙටිකාලීන ආර්ථික වර්ධන ප්‍රතිඵල නොව වර්තමානයේ මෙන්ම දිගුකාලීනව ද සමාජ ආර්ථිකමය යහපැවැත්ම තහවුරු කෙරෙන තිරසාර ආර්ථික දැක්මක් බෞද්ධ දර්ශනය තුළ ගැබ් වී ඇත. ආරියරත්න (1999) සිය *ෂූමාකර් දේශන* තුළින් ඉස්මතු කර පෙන්වා දෙන පරිදි ලෞකික ජීවිතය තෘප්තිමත්ව ගත කිරීම බුදුදහමට කිසිසේත් පටහැනි නො වේ. මූලික අවශ්‍යතා සපුරා ගැනීමට අසමත් වන්නේ නම් ජීවිතය තෘප්තිමත්ව ගත කළ නො හැකි අතර එය අගතියට ද හේතු වෙයි. ආර්ථික සුරක්ෂිතතාව නැති පුද්ගලයකු නිතර අසහනයෙන් පෙළෙන අතර යහපත් ක්‍රියාවන් පිළිබඳ සිතක් පහළ වීමට හෝ ඉඩක් නොමැත. එබැවින් ආර්ථික දියුණුව ළඟා කරගත යුතු වෙයි. ධනයේ සහ ධනය රැස් කිරීම් නියමාර්ථය පිළිබඳ කෙරෙන පැහැදිලි කිරීම් අනුව ධනය නිෂ්ඨාවන් සාධනය කිරීමේ මාධ්‍යයක් බව ද පෙන්වා දෙනු ලැබෙයි.[3] ලෞකික සුභසිද්ධියට ගමන් කිරීමේ සාධක ලෙස උත්සාහය, ආරක්ෂාව, යහපත් සමාජ ආශය හා අය-වැය සමව පවත්වා ගැනීම[4] බුදු දහම තුළ පැහැදිලිව පෙන්වා දී ඇති බව මහතන්ත්‍රිගේ (2003) පවසයි.

---

[3] අංගුත්තර නිකායෙහි ව්‍යග්ඝපජ්ජ සූත්‍රය

[4] උට්ඨාන සම්පදාව හෙවත් කාර්යයෙහි දක්වන උද්යෝගය, ආරක්ඛ සම්පදාව හෙවත් විනාශ දොරටු වසා ගැනීම, කල්‍යාණ මිත්තතා හෙවත් විශ්වාසවන්ත පිරිසක් ආශ්‍රය කිරීම, සමජීවිකතා හෙවත් බුද්ධිමත්ව ධනය පරිහරණය කිරීම් සිගාලෝවාද සූත්‍රය

*නිෂ්පාදනය*

ධනය නිෂ්පාදනය සම්බන්ධයෙන් ඉදිරිපත් කළ දර්ශනය කවර ආර්ථික දැක්මකට වුව උචිත වෙයි. ආර්ථික ක්‍රියාවලියක් සඳහා තත් විෂය සම්බන්ධයෙන් ව්‍යවසායකයා සතුව පැවතිය යුතු දක්ෂතාව, විශේෂඥතාව හෝ නිපුණත්වය; එම දක්ෂතාව ඔප් නැංවෙන පරිදි ව්‍යවසායකයා තුළ ගොඩනඟා ගත යුතු කාර්යශූරත්වය හා උදාසීන-අලස-කම්මැලි-නිද්‍රාශීලි ගති පැවතුමෙන් බැහැර වීම; තමාගේ නිෂ්පාදනයෙහි උපයෝගිතාව හා ඊට යෝග්‍යභාවය පිළිබඳ අවබෝධය සහ නොනිසි දේවලින් බැහැර වෙමින් නිසි නිෂ්පාදනයන් කලට වේලාවට, නිපැයීම හා සැපයීම; මනා සංවිධාන සැලසුමකින් යුතුව කටයුතු කිරීම[5]; ඉස්මතු කර දක්වනු ලැබ තිබේ. නිෂ්පාදන ක්‍රියාවලියේදී අත්‍යවශ්‍යම කළමනාකරණ සංකල්පයක් ලෙස ද මෙය ඉදිරිපත් කළ හැකි ය.

බුදු දහම "පාර ලෞකික" බවට ද ඒ අනුව සමාජ බලවේග හෝ සමාජ ව්‍යාපාර පිළිබඳ දැක්මක් බෞද්ධ දර්ශනයට නොමැති බවට ද හයින්ස් බෙෂර්ට්[6] කරන ප්‍රකාශය සමඟ ධර්මසේන හෙට්ටිආරච්චි (2002) එකඟ නො වේ. ලෞකික සැප අමතක කර ලෝකෝත්තර සැපයක් සොයා යන ලෙස බුදු දහමෙහි කිසිවිටෙක නො පැවසේ. බුද්ධ දර්ශනය පුද්ගල තෘප්තිය හෝ සමාජ ආර්ථික සමෘද්ධිය ප්‍රතික්ෂේප නො කරයි.[7] ඉන් ඔබ්බට ගොස් ධනය ඉපැයීම සහ හිමිකර ගැනීම ආර්ථික සුරක්ෂණයට සහ ආත්ම අභිමානයට හේතු වන බවත්, එම ධනය තමන් ගේ, තම පවුලේ, ඥාති හිතවතුන් ගේ, සේවකයන් ගේ අවශ්‍යතා වෙනුවෙන් උපයෝජනයට මෙන්ම අන්‍යන්ට උදව් කිරීම සඳහා යොදා ගැනීමට හැකි වීම තුළින් තෘප්තියට පත් විය හැකි බවත් පෙන්වා දෙයි. මින් පෙනී යන්නේ ධනය සහ සම්පත් උපයා-සපයා ගැනීමේ වැදගත්කම බෞද්ධ දර්ශනයේ ප්‍රකාශිතවම ගැබ් වී ඇති බවයි.

*පරිභෝජනය*

ධාර්මිකව වස්තු ඉපයීම පිළිබඳව පමණක් නොව උපයා ගත් ධනය පරිහරණය කළ යුතු ආකාර පිළිබඳව බුදු දහමේ අන්තර්ගතය ද අර්ථ ශාස්ත්‍රමය මඟ පෙන්වීමකි. සමජීවිකතාව තුළින් තුලිත අය-වැයක් පවත්වා ගනිමින් මූල්‍යමය ස්ථාවරතාව ඇති කර ගත යුතු ය. නූතන මූල්‍ය කළමනාකරණයේ එන ආදායම් විශ්ලේෂණය, අවදානම් කළමනාකරණය ආයෝජන සැලසුම්කරණය ආදී සංකල්ප ද බෞද්ධ ආර්ථික දර්ශනයෙන් පිළිබිඹු වෙයි. ණය නොමැති වීම තුළ නිවහල් බවේ සතුට අන්තර්ගත වේ.[8] ආධ්‍යාත්මික විමුක්තිය සෙවීමට ද මෙම පදනම උපකාරී වෙයි. තම ආදායම කොටස් සතරකට බෙදා මනාව පරිහරණය කළ යුතු ආකාරය පිළිබඳව උපදෙස් දෙනු ලැබෙයි. ඉපැයීම්වලින් සියයට විසි පහක ඉතුරුම් නිර්දේශයක් ද එම දැක්ම තුළ අන්තර්ගත වේ. ආර්ථික ස්ථාවරත්වය හා අවදානම කෙරෙහි පූර්ව සූදානම ඉතා වැදගත් බව ඉන් නිරූපණය වෙයි. සාර්ථක

---

[5] "දක්ඛො - අනලසො - තත්‍රූපාය වීමංසාය සමන්නාගතො - අලංකාතුං - අලංසංවිධාතුං" ව්‍යග්ඝපජ්ජ සූත්‍රය

[6] Bechert Heinz, in his article on Buddhism as a Factor of Political Modernisation: The Case of Sri Lanka, in *Religion and Development in Asian Societies*, published by Marga Publication, Colombo, Sri Lanka, 1974, as quoted by Dharmasena Hettiarachchi (p 33)

[7] ධම්මික සූත්‍රය (Ven. Yatagama Dhammapala, H.M. Moratuwagama, 1996)

[8] අණන සුඛය

පුද්ගලයෙකු වීම සඳහා කළ යුතු - නො කළ යුතු දේ පිළිබඳ මඟ පෙන්වීමක් ද කෙරෙයි. වීර්යයෙන් තොර වීම, අලස වීම, සැප සම්පත් තනිව භුක්ති විඳීම ආදිය පරාභවයට හේතු වන බවත් ; ශිල්ප දන්නා බව, නිවැරදි කර්මාන්ත කිරීම, ලද දෙයින් සතුටු වීම යනාදිය මංගල කරුණු බවත් බුදු දහමෙහි උපුටා දැක්වෙයි.[9] එම අර්ථ රටාවට අනුකූල වූ දිවි පෙවෙතක් අනුගමනය කිරීම තුළින් තෘප්තිමත් ජීවිතයක් ගත කිරීමේ හැකියාව ලැබේ.[10] මෙහිදි "තෘප්තිමත්" යන වචනය නිවැරදිව නිර්වචනය විය යුතු අතර ලෞකික තෘප්තිය පිළිබඳ අසීමාන්තික ගිජුකම සහ දිළිඳුකමින් පෙළෙමින් මූලික අවශ්‍යතා තෘප්ත කර ගැනීමට පවා නොහැකි වීම යන **අන්ත දෙක** බැහැර කරමින් මධ්‍යම ප්‍රතිපදාවෙන් ගත කරන උපේක්ෂා සහගත සරල ගෘහ ජීවිතයක් බෞද්ධ දර්ශනයෙන් නිර්දේශ කෙරෙයි.[11]

*සුසමාදර්ශීය වෙනස*

බෞද්ධ ආර්ථික දර්ශනය වර්තමාන ලෝකය විශේෂිව හඳුනා ගන්නා විෂය පථයක් නොවේ. එය ජාතික ආදායම, නිෂ්පාදන සහ මිලදී ගැනීමේ හැකියා වර්ධනය, කාර්යක්ෂමතා වර්ධනය හෝ පූර්ණ සේවා නියුක්තිය වැනි "උද්යෝග පාඨයන්ට" කොටු වූ සීමිත හැකියාවන් සහිත ආකෘතියක් ද නොවේ. එය මිනිස් ජීවිතයේ සතුට සහ සැනසුම කරා වූ පූර්ණ, සමස්ත සහ ඒකාබද්ධ ප්‍රවේශයකි. ඒ උදෙසා අවශ්‍ය විප්ලවීය වූ නමුත් හිංසනයෙන් වියුක්ත වූ සමාජමය වෙනස වෙත ආමන්ත්‍රණය කරන්නකි. ගැටලු නිරාකරණයේ බෞද්ධ ප්‍රවේශය ආනුභවික, ප්‍රායෝගික හා සමස්ත වූවකි. ඒ තුළ ද්‍රව්‍යමය මෙන්ම ආධ්‍යාත්මික සංවර්ධනය ද අතිනත් ගෙන යා යුතුය. ස්වාර්ථය වෙනුවෙන්ම සම්පත් රැස් කිරීම හඹායන නූතන ආර්ථික දැක්මෙන් කැපී පෙනෙන වෙනසක් බෞද්ධ ආර්ථික ප්‍රවේශයේ ඇති වන්නේ මෙම අතිනත් ගැනීම තුළ දී ය. ආරියරත්න[12] විසින් උපුටා දැක්වෙන පරිදි ෂූමාකර් පවසන්නේ වෙනත් විශේෂඥයන් මෙන්ම අර්ථ ශාස්ත්‍රඥයන් ද ඔවුන්ගේ ශාස්ත්‍රය පූර්ව කල්පිතයන්ගෙන් තොර වූ පරිපූර්ණ හා ස්ථාවර සත්‍යයක් බව විශ්වාස කරන යම් ආකාරයක *පාරභෞතික අන්ධභාවයකින්* පෙළෙන්නන් බවයි. ඔවුන් අතරින් සමහරුන් සිතන්නේ ආර්ථික විද්‍යා න්‍යායන් ගුරුත්වාකර්ෂණ නියාමයන් මෙන් පාරභෞතික විද්‍යාවන්ගෙන් හෝ අගයයන්ගෙන් වියුක්ත වූවක් ලෙසිනි. ෂුමාකර් පවසන්නේ කිසියම් ආධ්‍යාත්මික හෝ ආගමික අගයකට වඩා ආර්ථික වෘද්ධිය වැදගත් කොට සලකන්නවුන් පවා බෞද්ධ අර්ථශාස්ත්‍රය හැදෑරීම වර්තමාන අත්දැකීම් සඳහා මෙන්ම දිගුකාලීන අවස්ථා උදෙසා වැදගත්වන බවයි. "එය නූතන වෘද්ධිය සහ ගතානුගතික *එක තැන පල්වීම* අතර තෝරා ගැනීම පිළිබඳ ප්‍රශ්නයක් නොවේ. එය *ද්‍රව්‍යවාදී උමතුව* සහ *ගතානුගතිකවාදී අබ්බගාතබව* යන දෙ අන්තය අතරින් සංවර්ධනය කරා විහිදුනු නිවැරදි මැද මාවත සොයා යාමකි. කෙටියෙන් කිවහොත් නිවැරදි ජීවන මාර්ගයයි" (ආරියරත්න, 9 වැනි පිටුව). බටහිර ආර්ථික දැක්ම තුළ සදාචාරවත් බවට ස්ථානයක් නොමැත. බෞද්ධ ආර්ථික දැක්ම හා බටහිර ආර්ථික දැක්ම අතර ඇති ප්‍රධාන බෙදීම මෙයයි.

---

[9] මහා මංගල සූත්‍රය හා පරාභව සූත්‍රය (Chandima Wijebandara, H.M.Moratuwagama, 1999)

[10] ව්‍යග්ගපජ්ජ සූත්‍රය

[11] Ariyaratne, ibid (p 5)

[12] Ariyaratne, ibid (p 5)

ලෝක ආර්ථිකයේ පරිණාමය තුළ අවශ්‍යතා-පාදක අර්ථ රටාවෙන් ක්‍රමානුකූලව උවමනා-පාදක රටාවක් කරා ගමන් කළ ආර්ථිකයන් විශේෂ වශයෙන් කර්මාන්ත විප්ලවය සහ යටත්විජිතකරණය මෙන්ම විද්‍යා හා තාක්ෂණ දියුණුව කරණ කොට ගෙන වඩ වඩාත් ගිජුකම-පාදක වූ ආර්ථිකයන් දක්වා පරිවර්තනය වූ අයුරු නිරීක්ෂණය කළ හැකිය. මේ තුළින් මිනිස් සමාජයට හා ජෛවගෝල පරිසරයට සිදු වූ විනාශකාරී බලපෑම සුළුපටු නොවේ. තාක්ෂණික පුනරුදයත් හේතු කොටගෙන ඇති වූ මහා පරිමාණ නවෝත්පාදන හා නව සොයා ගැනීම් කෙටි කාලීනව මිනිසා ගේ කෑදරකම යම් තරමකට තෘප්ත කිරීමට ප්‍රමාණවත් වුව ද බොහෝ විද්‍යාඥයන් ගේ සහ දාර්ශනිකයන්ගේ මතය වනුයේ නුදුරු අනාගතයේදීම එම අසාමාන්‍ය දියුණුවෙහි අනිටු විපාක විඳිමින් මිහිමතින් අතුරුදහන් වීමට පවා මිනිසාට සිදුවිය හැකි බවයි. ක්‍රිස්තු වර්ෂයෙන් තෙවන සහශ්‍රකයට ප්‍රවිෂ්ට වී සිටින අපි මේ වන විට එම අනුවර්තනයේ පූර්ණ ව්‍යසනය දක්වා වූ ප්‍රමාණාතික්‍රම ඉදිරි පිම්මකට මුහුණ දී සිටිමු.[13]

*මිනිස් ශ්‍රමය*

නූතන ලිබරල් ආර්ථික විද්‍යාවේ සහ මාක්ස්වාදී ආර්ථික න්‍යායේ මෙන්ම බෞද්ධ ආර්ථික දර්ශනයේ ද මිනිස් ශ්‍රමයට හිමිවන්නේ වැදගත් ස්ථානයකි. එහෙත් බෞද්ධ ආර්ථිකයේ මිනිස් ශ්‍රමය යනු ස්වභාවික සම්පත් මත මූල්‍යමය අගය එකතු කරන හුදු ආර්ථික සාධකයකට ඔබ්බෙන් වූ මානව සම්පතකි. එය සේව්‍ය-සේවක සම්බන්ධතා, ශ්‍රමික සුබසාධනය, සේවා නියුක්තියේ සතුට හා තෘප්තිමත් බව ද ආවරණය කෙරෙන පරිදි පුළුල් වූවකි. නිෂ්පාදන කාර්යයේ දී ශ්‍රමය කෙරෙහි අභිමානයක් ඇති කිරීම බුදු දසුනෙන් අවධාරණය කෙරෙයි. සේවකයා ගේ අභිමානය රැකීම සඳහා සේව්‍යයා විසින් කළ යුතු කාර්යභාරය[14] මෙන්ම ඒවා ඉටු කෙරෙන විට සේවකයා විසින් ඉටු විය යුතු කාර්යභාරයන්[15] පිළිබඳව ද අවධාරණය කෙරෙයි. ශ්‍රම විභජනය සහ විශේෂීකරණය බෞද්ධ ආර්ථික දර්ශනය තුළ ප්‍රතික්ෂේප නො කෙරේ. එහෙත්, එ වන් වූ විභජනයක් හෝ විශේෂීකරණයක් මත ශ්‍රමිකයා තරාකරණයට ඒ තුළ ඉඩක් නොමැත. ශ්‍රමිකයා ගේ මිනිස් අවශ්‍යතා තෘප්ත විය යුතු ය. ඊට සරිලන වේතන ඔහුට ගෙවනු ලැබිය යුතු ය. ඒ තුළ ශ්‍රම සූරාකෑමකට හෝ ශ්‍රම ඒකාධිකාරයන් තුළින් අධිවේතන කේවල් කිරීමට හෝ අවශ්‍ය නො වේ. ශ්‍රමිකයා ගේ පුහුණුව, ශාරීරික-මානසික යෝග්‍යතාව, සේවක උද්යෝගය, සුබසාධනය, නිවාඩු, සෞඛ්‍ය ආරක්ෂණය සහ දිරිගැන්වීම ද සාධාරණ වැටුප් ගෙවීමට අමතරව සිදු කෙරන අර්ථක්‍රමයක් තුළ එවැනි සූරාකෑම් හෝ කේවල් කිරීම් අදාළ නො වේ.

*රජයේ කාර්ය භාරය*

සාර්ව දේශපාලන-ආර්ථික රාමුව තුළ සාමය හා සමෘද්ධිය උදෙසා බෞද්ධ ආර්ථික දර්ශනයේ ඉගැන්වීම් ඉතා කාලීන වේ.[16] නිෂ්පාදනයේ අවප්‍රමාණ වීමක් හෝ භාණ්ඩ හා සම්පත් බෙදාහැරීමේ අකර්මන්‍යතා නිසා සමස්ත ආර්ථික ව්‍යුහයම බිඳ වැටීමට හා ඒ තුළින් ව්‍යාකූලත්වයට හා විනාශයට තුඩු දිය හැකි අයුරු පෙන්වා දෙනු ලැබ ඇත. රජය

---

[13] "We witness that we are now ready to make a quantum jump into total oblivion", Ariyaratne (ibid) p9.

[14] සිගාලෝවාද සූත්‍රය

[15] කූසීතාරම්භ සූත්‍රය

[16] චක්කවත්ති සීහනාද සූත්‍රය, කූටදන්ත සූත්‍රය සහ අග්ගඤ්ඤ සූත්‍රය

මැදිහත් වී එවැනි තත්වයන් වළක්වාලිය යුතු ය. රටක සම්පත් අතලොස්සක් විසින් මෙහෙයවනු ලැබීමට ඉඩ නො තැබිය යුතු ය. මහජනතාව සතු එම සම්පත් උත්සව සහ සංදර්ශනය වෙනුවෙන් නාස්ති නො කළ යුතු අතර ග්‍රාමීය සම්පත් එවැනි සංදර්ශන සඳහා නගරය වෙත උකහා නො ගත යුතු ය. "විවේක පංතියේ න්‍යාය" නැමැති තම කෘතියෙන් තෝර්ස්ටයින් වෙබ්ලන් (1899) විසින් *සන්දර්ශනාත්මක පරිභෝජන* නැඹුරුව ලෙස හඳුන්වා දෙන ලද "අන්‍යයන් ඉදිරියේ කැපී පෙනීම සඳහා තමන්ට අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ පරිභෝජනය" කරා යොමු වීමෙන් සම්පත් නාස්තියක් උද්ගත වෙයි. එය ඉතා හානිකර ය.

*අරපිරිමැස්ම සහ නාස්තිය පිටු දැකීම*

සම්පත් නාස්තිය සම්බන්ධයෙන් බෞද්ධ ආර්ථික දර්ශනය දක්වන්නේ සුවිශේෂී අවධානයකි. සම්පත් හානි වීමේ ඉඩකඩ හා ඉන් වලක්වාලීමේ මාර්ග ද බෞද්ධ ආර්ථික දර්ශනය තුළ ප්‍රකාශිතව සඳහන් වී ඇත. අල්පේච්ඡ ජීවන රටාව හා ඉතුරුම් ආර්ථිකය ඉතා වැදගත් වෙයි. යුරෝපීය රටවල් තමන් වර්තමානයේ මුහුණ පා සිටින ණය අර්බුදයට විසඳුම් වශයෙන් ඉදිරිපත් කර ඇත්තේ ද දැඩි පිරිමැස්ම බවත්, අපිස් ජීවිතයකට තම රටවැසියන් හුරු කරවීම සඳහා දෘඪශීලී ප්‍රතිපත්ති රැසක් බවත්, රජයේ වියදම් කපා හැරීම, වැටුප් සීමා කිරීම, ණය සීමා කිරිම ඉන් සමහරක් බවත්, මේ බෞද්ධ දර්ශනයේ එන සරල දිවිපැවැත්ම පිළිබඳ සංකල්පයට ප්‍රවේශ වීමක් බවත්, සෝමසුන්දර (2013) ගේ මතයයි. ණය නො වී ජීවත් වීම ගෘහස්ථයාට ලද හැකි සැපතක් බව සඳහන් වුව ද,[17] ඵලදායී ආයෝජන අවශ්‍යතා සඳහා ණය ගැනීම වරදක් නො වේ. ණය ගැනීම නූතන ආර්ථිකයෙහි ප්‍රාග්ධනය සපයා ගැනීමේ ප්‍රධානම අංගයක් ලෙස සැළකේ. කාමයෝගී දිළින්දාට ණය ගැනීම දුකක් වුව ද[18] ගෙවීමේ සැලසුමක් ඇති පුද්ගලයා තම ව්‍යාපාර දියුණු කර ගැනීම සඳහා ණය ගැනිම වරදක් බව බුදුසමය අවධාරණය නො කරයි.

ආර්ථික භාණ්ඩ ප්‍රශස්ත ලෙස උපයෝජනය නාස්තිය පිටු දැකීමට මෙන්ම පරිසර සංරක්ෂණයට ද ඉවහල් වෙයි. වර්තමානයේ දී ඉසුරුමත් පන්තියේ පමණක් නොව සාමාන්‍ය ජනතාව අතරින් පවා "නැවත නැවතත් භාවිතය" (re-use) ගිළිහෙමින් පැවතීම සම්පත් නාස්තියට සොරොව් දොරටු විවර කිරීමකි. බෞද්ධ දර්ශනය තුළ ආර්ථික භාණ්ඩ අවම ලෙස ඉවත දැමෙන පරිදි යළි-යළිත් භාවිතයට ගැනීම පිළිබඳ ඉතාම සාරවත් දැක්මක් ඉගැන්වෙයි. භික්ෂූන් තම සිවුරු පෙරවීමට නො හැකි තරමට පරණ වූ විට ඒවා ඇඳ ඇතිරිලි බවට පත් කරගන්නා බවත්, තව ද පරණ වන විට පාපිස්නා සකසා ගන්නා බවත්, ඊටත් පරණ වන විට ජලයෙහි තෙමා බිත්ති පිරිසිදු කර ගන්නා බවත්, තව දුරටත් දිරාපත් වන විට සිහින්ව කපා මැටි සමඟ අනා කුටි තනා ගන්නා බවත්, බෞද්ධ සාහිත්‍යයේ ඇගැයීමට පාත්‍ර වෙයි.[19] නූතනයේ මෙම සංකල්පය "ප්‍රතිචක්‍රීකරණය" ලෙසින් අපට ඉගැන්වේ. බෞද්ධ සාංස්කෘතික පදනමක් සහිත ලාංකීය සමාජයේ මීට අනුකූල ආර්ථික පිළිවෙත් මෑතක් වන තුරු ම පැවැතිණි. අධ්‍යාපනික විෂය මාලාවට නියමිත පරණ පොත්, ඇඳුම් පැළඳුම් නැවත නැවත භාවිතයට ගන්නා ක්‍රමවේද පැවැතිණි. එහෙත්, නූතනයේ ප්‍රදර්ශනාත්මක පරිභෝජන රටාව තුළ ඇතැම් වාහන, යන්ත්‍ර-සූත්‍ර, දුව

---

17 අංගුත්තර නිකායේ අණන සුත්‍රය

18 අංගුත්තර නිකායේ ඉණ සුත්‍රයේ

19 චුල්ලවග්ග පාලි

උපකරණ, පරිගණක හා තාක්ෂණික මෙවලම් පවා ඉතා සුළු අඩු-පාඩුවක් මත ඉවතලනු දැකිය හැකි ය. එය බෞද්ධ අර්ථ රටාවට පටහැනි නැඹුරුවකි.

*පොදු අයිතිය*

පොදු අයිතිය පිළිබඳව මූලධර්මයට ද ඉහළ ප්‍රමුඛතාවක් බෞද්ධ දර්ශනය තුළ ලබා දී ඇත. දේපොළ පොදු වශයෙන් පරිභෝජනය කිරීම බෞද්ධ ආර්ථික දර්ශනයට අනුව ඉතාම උසස් ධන විභජන ක්‍රමය වන බව ගුණපාල ධර්මසිරි (1986) සඳහන් කරයි. මේ බව ප්‍රතික්ෂේප නො කරන ධර්මසේන හෙට්ටිආරච්චි සඳහන් කරන්නේ භෞතික සම්පත්වල හිමිකාරත්වය වඩ වඩාත් කෑදරකමට මිනිසා පෙළඹවීමට ඉඩ ඇති නමුත් කෑදරකමට එකම සාධකය නිෂ්පාදන සාධකයන්ගේ පෞද්ගලික අයිතිය ලෙස බෞද්ධ දර්ශනයේ දී නොසැළකෙන බවයි. පාරිභෝගිකයා විසින් සම්පත් හඹා යෑමේ අසීමාන්තික පෙළඹීම පාලනය කර ගත් විට සම්පත් තිබූ පමණින් එම අගතිගාමිත්වය උද්ගත නො වේ. මෙම දාර්ශනික පදනම මත පිහිටන බෞද්ධ ආර්ථික දැක්ම තුළ පොදු අයිතියට ඉහළ ප්‍රමුඛතාවක් හිමි වුව ද, පෞද්ගලික දේපළ ක්‍රමය සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කිරීමක් ගැබ් නො වන බව ඔහු ගේ මතය යි.[20]

*තිරසාරත්වයේ සංකල්පය*

නූතන අර්ථ ශාස්ත්‍රයේ විග්‍රහ කෙරෙන පරිදි වර්තමාන ආර්ථික ඒජන්තයන් තම උපයෝජනය උපරිම කිරීමට ආත්මාර්ථකාමීව ගනු ලබන පියවර වෙනුවට, වර්තමාන ජන සමාජය පමණක් නොව අනාගත පරපුරේ උපයෝජන අවශ්‍යතා ද තෘප්ත කරනු ලැබිය හැකි අයුරු ජාතික සම්පත් කළමනාකරණය රජයේ වගකීම වේ. ස්වභාවික සම්පත් සහ ජාතික ධනය සුරැකිය යුතු ය. ඒ සම්පත් ධරණීයව වර්ධනය වන පරිදි මනාව සැලසුම් කරන ලද සංවර්ධනාත්මක ආයෝජන ව්‍යාපාරයන් ක්‍රියාත්මක කළ යුතු ය.

ඒ නයින් බලන කල වර්තමානයේ ප්‍රමුඛත්වයෙහි ලා සැළකෙන තිරසාර සංවර්ධනය පිළිබඳ සංකල්පය ප්‍රථමයෙන් අපට හමු වන්නේ බෞද්ධ ආර්ථික දර්ශනය තුළ බව ද,[21] ක්‍රිස්තු පූර්ව හතරවන ශත වර්ෂයේ දී, මිහිඳු හිමියන් විසින් දෙවන පෑතිස් රජු වෙත කරන ලදැයි පිළිගැනෙන ප්‍රකාශනයෙන් බෞද්ධ ආර්ථික දර්ශනයේ අන්තර්ගත එම දැක්ම ඍජුවම පිළිබිඹු කෙරෙන බව ද, නිරීක්ෂණය වෙයි :

> *"මහරජ, ඔබ මේ රටේ, මේ පොළොවේ, මේ සම්පත්වල අයිතිකරු නො වේ. භාරකරු පමණි. ඔබගේ වගකීම වන්නේ ඒවායේ සැබෑ අයිතිකරුවන් වන මේ රටේ මහජනතාව ගේ පමණක් නොව සතා සිව්පාවා ගේ සහ ගහ-කොළ වල වර්තමාන පරපුරේ මෙන්ම අනාගත පරපුරුවල ද සුබසාධනය තහවුරු කෙරෙන පරිදි එම සම්පත් කළමනාකරණය කිරීමයි".*

---

[20] හෙට්ටිආරච්චි ධර්මසේන, ibid (පිටුව 332)

[21] මිහිඳු හිමියන් සිංහලද්වීපයට බුදු දහම හඳුන්වා දුන්නේ රතු ඉන්දියානු නායක *සියැටල් ජීවත් වූ යුගයට ශතවර්ෂ විස්සකටත්* පෙර දී ය.

## මූලාශ්‍ර සටහන් / REFERENCES


Ariyaratne A T, "*Shumarcher Lectures on Buddhist Economics"*, Sarvodaya Vishva Lekha Publication, Ratmalana, Sri Lanka, 1999.

Chandima Wijebandara, H.M.Moratuwagama. (1999). *බෞද්ධ ශිෂ්ටාචාරය: මූලධර්ම සහ වංශ කතාව*. Colombo.

Dharmasiri Gunapala, Buddishim and Marxism in the sociocultural context of Sri Lanka, vol24, no.4, Fundamental of Buddist Ethics, The Buddists Research Society, Singapore 1986

Dammajothi, V. B. (n.d.). *Buddhism and modern society.* Retrieved 11 13, 2013, from Buddha station: http://www.buddhastation.com/buddhism-articles/what-is-the-future-of-buddhism/

හෙට්ටිආරච්චි ධර්මසේන, මුල් බුදු සමයෙන් හෙළිවන බෞද්ධ ආර්ථික දර්ශනය, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, කොළඹ, ශ්‍රී ලංකාව, තෙ වන මුද්‍රණය, 2002

Kaldor, N. (Dec,1957). A model of Economic Growth. *The Economic Journal, vol 67* , pp 591-624.

Lakshman W D (2012), "*Globalisation and Financialisation : Implications for Developing Countries"*, Inaugural Speech of the SLERC-2012, Proceedings of the 1st International Economic Research Conference of the SLFUE, Colombo, Sri Lanka, November 2012

මහතන්ත්‍රිගේ ජී. (2003). [Mahathanthrige, G]. *ථෙරවාදී බුද්ධ ධර්මයේ මූලික ඉගැන්වීම.*

*Say's Law Of Markets.* (n.d.). Retrieved 11 23, 2013, from INVESTOPEDIA: https://www.google.lk/#q=j+b+say's+law+of+market

Schumacher, E. F. (n.d.). *Buddhist Economics.* Retrieved 11 25, 2013, from New Economics Institute: http://neweconomy.net/buddhist-economics

Sen, A. (1977). Rational fools, A critique of behavioral foundation of Economic theory. *philosophy and public affairs* , PP 317-344.

සෝමසුන්දර ජේ ඩබ්ලිව් ඩී. (2013). *සදාචාර ආර්ථික විද්‍යාව*, සමනල අධ්‍යාපන කේන්ද්‍රය බෙලිහුල්ඔය, ශ්‍රී ලංකාව, 2013

Smith, A. (1776). *An Inquiry into the Nature and Causes of the Wealth of Nations.* London: W. Strahan and T. Cadell, London.

Veblen, Thorstein. (1899). *Theory of the leisure Class : An Economic Study of Institutions*. New York: Macmillan

Ven. Yatagama Dhammapala,H.M. Moratuwagama. (1996). *බෞද්ධ විනය මාර්ගය හා පාලි භාෂා පරිචය.*